# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 පෙබරවාරි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 පෙබරවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 17.5%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 ජනවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 16.8%ක් ලෙස වාර්තා විය. 2022 පෙබරවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 11.7%ක හා ආහාර නොවන කාණ්ඩයේ 5.8%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 පෙබරවාරි මාසයේ 4.2%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 3.2%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.0%ක් විය. 2021 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2022 පෙබරවාරි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 ජනවාරි මාසයේදී 24.4% සිට 2022 පෙබරවාරි මාසයේදී 24.7% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 ජනවාරි මාසයේදී 10.2% සිට 2022 පෙබරවාරි මාසයේදී 11.0% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 ජනවාරි මාසයේ 166.0ක් වූ දර්ශකාංකය 2022 පෙබරවාරි මාසයේ 167.8ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 පෙබරවාරි මාසයේ දර්ශකාංකය 1.8ක වැඩිවීමක් එනම් 1.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.59%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.49%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට සහල්, මයිසූර් පරිප්පු, කිරිපිටි, පළතුරු, පොල්, මිරිස් කුඩු, තිරිඟු පිටි, රතු ළූණු, පොල්තෙල්, අළුත් මාළු, කරවල, වියළි මිරිස්, කුකුළු මස්, තුනපහ කුඩු, පාන්, සීනි සහ ළදරු කිරිපිටි යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. කෙසේ වෙතත් එළවළු, බිත්තර, දෙහි, අමු මිරිස්, ලොකු ළූණු සහ අර්තාපල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 පෙබරවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(බුලත්)*, 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(දර)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල්, වාහන සේවා ගාස්තු හා බස් ගාස්තු)*, 'විනෝදාත්මක හා සංස්කෘතික', 'ආපනශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'සෞඛ්‍ය', 'සන්නිවේදන' සහ 'අධ්‍යාපන' කාණ්ඩවල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 ජනවාරි මාසයේ 12.9% සිට 2022 පෙබරවාරි මාසයේ 14.1% දක්වා වැඩිවීමක් වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය**




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | පෙබ. | 142.8 | 152.8 | 134.9 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 6.9 | 1.9 | 4.1 |
| | මාර්තු | 142.1 | 150.7 | 135.3 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 8.8 | 2.0 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 150.8 | 135.5 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 9.7 | 2.2 | 4.1 |
| | මැයි | 143.6 | 153.3 | 135.9 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 10.3 | 2.5 | 4.2 |
| | ජූනි | 145.7 | 157.3 | 136.5 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 9.8 | 2.9 | 4.1 |
| | ජූලි | 146.6 | 158.5 | 137.2 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 11.0 | 3.2 | 4.4 |
| | අගෝ. | 147.1 | 159.4 | 137.4 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 11.1 | 3.0 | 4.7 |
| | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |